බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙහි

<u>නියාමන සේවා ගණයේ බන්ධනාගාර නියාමක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය.</u>

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව: බන්ධනාගාර

| | | |
|---|---|---|
| යොමු අංකය : | ඩී8/21/නි.බ.පටිපාටි | දිනය: 2014.02.11 |
| | ඩී8/21/බ.පරි/නියාමක | දිනය: 2016.05.14 |
| | ඩී8/21/බ.පරි/නියාමක | දිනය : 2016.10.29 |
| | ඩී8/21/බ.පරි/නියාමක | දිනය : 2017.08.23 |
| | ඩී8/21/බ.පරි/නියාමක | දිනය : 2018.06.25 |
| | ඩී8/21/බ.පරි/නියාමක | දිනය : 2018.12.12 |

1.2 අමාත්‍යාංශය: අධිකරණ හා ජාතික ඒකාබද්ධතා

| | | |
|---|---|---|
| යොමු අංකය : | MRPR/2/317-12 | දිනය: 2014.02.21 |
| | MOJ/E22/බඳවා ගැනීමේ පටිපාටිය | 2018.10.06 |
| | MOJ/E22/බඳවා ගැනීම් පටිපාටි/නියාමක | 2019.01.02 |

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම

| | | |
|---|---|---|
| යොමු අංකය : | DMS/B2/48/01/Vol - II | දිනය : 2013.09.24 |
| | DMS/1146 | 2014.08.25 |

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :

| | | |
|---|---|---|
| යොමු අංකය : | EST-2/RECRU/05/4858 | දිනය : 2014.05.06 |
| | EST-2/RECRU/05/4858 | 2016.08.18 |
| | EST-2/02/RECRU/05/4858 | 2018.11.14 |

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය :

| | | |
|---|---|---|
| යොමු අංකය : | NCP/6/18/096/SR | දිනය : 2013.04.09 |
| | NCP/6/18/096/SR | 2014.04.21 |
| | NCP/6/18/096/SR | 2014.05.12 |
| | NCP/6/18/096/SR – II | 2016.07.20 |
| | NSCC/3/40/94/SR | 2018.08.16 |

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :

| | | |
|---|---|---|
| යොමු අංකය : | PSC/EST - 02-01-18/02/2014 | දිනය : 2014.11.20 |
| | පළමුවන සංශෝධිත දිනය : | 2019.02.21 |
| | දෙවන සංශෝධිත දිනය : | 2024.10.02 |

02. පත් කිරීමේ බලධරයා: රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

03.සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : නියාමන සේවා

3.2 ශ්‍රේණි : බන්ධනාගාර නියාමක
බන්ධනාගාර සැරයන්

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

බන්ධනාගාර ආයතනයන්හි පරිපාලනයට සහාය වීම සහ බන්ධනාගාරගත නේවාසිකයන්ගේ ආරක්ෂාව සැලසීම සහ ඔවුන් ආරක්ෂණය කිරීමට සහාය වීම.

3.4 කාර්යයන් පැවරීම:

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යෝග්‍යතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැකිය.

04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව ඉදිරියේදී රජය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.)

05. වැටුප්
5.1 වැටුප් කේත අංකය : නියාමක - RS - 01 - 2016
සැරයන් - RS - 02 - 2016

5.2 මාසික වැටුප් පරිමාණය : නියාමක 29,540-7 x 300-27 x370 -41,630/-
සැරයන් 32,010–9 x370-17x495- 43,755/-

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| නියාමක | පියවර 01 | 29,540/- |
| සැරයන් | පියවර 01 | 32,010 /- |

2016 සිට 2020 දක්වා වැටුප් ගෙවිය යුත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 උපවගන්තිය II හි සඳහන් පරිදි විය යුතුය.

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා තනතුරුවලට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | | කාර්යයන් |
|---|---|---|---|---|
| | | පිරිමි | කාන්තා | |
| බන්ධනාගාර නියාමක | | 4447 | 594 | බන්ධනාගාර නේවාසිකයින්ගේ ආරක්ෂාව හා රැකවරණය ලබා දීම, අධිකරණවලට ඉදිරිපත් වීම සහ අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීම, ආරක්ෂණ හා අනෙකුත් කටයුතු වලදී කාර්යභාර නිලධාරී වශයෙන් කටයුතු කිරීම, ගබඩා රාජකාරි ඉටු කිරීම. |
| සැරයන් | | 892 | 38 | |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : බන්ධනාගාර නියාමක (පිරිමි/කාන්තා) : 5041
සැරයන් (පිරිමි/කාන්තා) : 930

07. බඳවා ගැනීමේ ක්‍රමය
7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 95% |
| සීමිත | 05% |
| කුසලතා | - |

සටහන : බඳවා ගැනීම යටතේ සීමිත බඳවා ගැනීම 05% ක නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවේදී එම අඩු සංඛ්‍යාවද විවෘතව බඳවා ගනු ලැබේ.

7.2 විවෘත බඳවා ගැනීම
7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : බන්ධනාගාර නියාමක

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව විෂයන් හයක් (06) කවර හෝ විෂයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව සමත් වී තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් :

I. අවම උස අඩි 05 අඟල් 04 (පිරිමි)
II. අවම උස අඩි 05 අඟල් 02 (කාන්තා)
III. පිරිමි අයදුම්කරුවන් සඳහා පපුව හුස්ම නාල්ලා අඟල් 32 ක් විය යුතුය

7.2.2.5 වෙනත්

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
II. මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතු අතර, යහපත් චරිතයකින් ද යුක්ත අයවලුන් විය යුතුයි. එය පොලිස් නිෂ්කාෂණ වාර්තාවක් මගින් සනාථ කර ගැනීමට කටයුතු කෙරේ.
III. චරිත දූෂණයට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම ඉහත තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුස්සකමක වන්නේය.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා 7.2.2.1 සිට 7.2.2.4 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කළ යුතුය.
V. අවිවාහක විය යුතුයි. (දික්කසාද වූවන් හා වැන්දඹුවන් මේ සඳහා විවාහකයන් සේ සලකනු ලැබේ.)

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව : අවු. 18 ට නොඅඩු

උපරිම සීමාව : අවු. 30 ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.2.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය බුද්ධිය | 100% | 40% |
| සාමාන්‍ය දැනුම | 100% | 40% |

ඇමුණුම 04 බලන්න.

7.2.4.1.1 විභාගය පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - අදාළ නොවේ.

7.2.4.4. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | 25 | අදාළ නොවේ |
| වෘත්තීය සුදුසුකම් | 15 | |
| ක්‍රීඩා කෞෂල්‍යය | 30 | |
| නායකත්වය හා ප්‍රජා සේවාවන් | 25 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

සටහන

(I) ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටියක් අනුමත කිරීම බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ඇත.

(II) පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයක් ලිඛිත විභාගයෙන් ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන්ගේ විභාග අංක හා නම් අකාරාදී පිළිවෙලට විභාග කොමසාරිස් ජනරාල් වෙතින් ගෙන්වා ගෙන එම අයදුම්කරුවන් සඳහා පමණක් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයක් හෙවත් ඔරොත්තු දීමේ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

පිරිමි - මීටර් 1000 (1 km) මිනිත්තු 03 තත්පර 44 ක කාලයක් තුළ දිවීම.
කාන්තා - මීටර් 400 (0.4 km) මිනිත්තු 02 තත්පර 05 ක කාලයක් තුළ දිවීම.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් යෝග්‍යතා පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලැබේ.

(III) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තු දීමේ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් පමණක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කෙරේ. මූලික සුදුසුකම් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම පරීක්ෂා කරනු ලැබේ. (ලිඛිත විභාගයේදී අයදුම්කරුවන් ලබාගත් ලකුණු මෙම අවස්ථාවේදී සැලකිල්ලට ගනු නොලැබේ.)

(IV) යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී එක් එක් අයදුම්කරුවන් ලබාගත් ලකුණු නැවත විභාග කොමසාරිස් ජනරාල් වෙත යැවීමෙන් පසු එම අපේක්ෂකයින් ලිඛිත විභාගයේදී සහ යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් මුළු ලකුණු එකතුව මත පිළිවෙලින් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් නියාමක තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

7.2.4.4.1. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම හා වෙබ් අඩවියෙහි පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම :

7.3.1. බඳවා ගන්නා ශ්‍රේණිය : බන්ධනාගාර නියාමක

7.3.2. සුදුසුකම් :

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව විෂයයන් හයක් (06) කවර හෝ විෂයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව සමත් වී තිබීම.

7.3.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.3. පළපුරුද්ද :වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති තනතුරේ ස්ථිර කර ඇති බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවය කරන ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය. නැතහොත් තනතුරේ ස්ථිර කර ඇති වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සහිත බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අවම වශයෙන් වසර 03 ක් සේවය කර ඇති ඒකාබද්ධ සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය.

7.3.2.4. කායික සුදුසුකම් :
- I. අවම උස අඩි 05 අඟල් 04 (පිරිමි)
- II. අවම උස අඩි 05 අඟල් 02 (කාන්තා)
- III. පිරිමි අයදුම්කරුවන් සඳහා පපුව හුස්ම නාල්ලා අඟල් 32 ක් විය යුතුය.

**7.3.2.5. වෙනත්** :

තනතුරට බඳවා ගැනීම සඳහා ඉහත 7.3.2.3 සිට 7.3.2.4 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවන නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කල යුතුය.

7.3.3.වයස : අදාළ නොවේ.

7.3.4. බඳවා ගැනීමේ ක්‍රමය

7.3.4.1. ලිඛිත විභාගය : අදාළ නොවේ

7.3.4.2. වෘත්තීය පරීක්ෂණය :අදාළ නොවේ.

7.3.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: අදාළ නොවේ.

7.3.4.4. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ප්‍රශංසා | 05 | අදාළ නොවේ |
| ක්‍රීඩා | 10 | |
| යහපත් සේවයට වාර්තා කිරීම | 05 | |
| උසස් අධ්‍යාපන පුහුණුව | 05 | |
| ජ්‍යෙෂ්ඨතාවය | 20 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| එකතුව | 50 | |

සටහන :

(I) ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත එක් එක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

(II) යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

7.3.4.4.1. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

7.3.5.අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : බන්ධනාගාර ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම :

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | නියාමක තනතුරට පත්වී වසර 03 ක් ගත වීමට පෙර | ලිඛිත |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | සැරයන් තනතුරට පත්වී වසර 03 ක් ගත වීමට පෙර | ලිඛිත |

(විෂය නිර්දේශය සඳහා ඇමුණුම 01 බලන්න.)

සේවයට බඳවා ගැනීමෙන් පසු සෑම වසර 2 ටම වරක් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, එම පරීක්ෂණයෙන් සමත්විය යුතුය.) ශාරීරික යෝග්‍යතා මණ්ඩලය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පත්කරනු ඇත.

8.2කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්
8.3කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද: බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

09. භාෂා ප්‍රවීණතාවය
9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවයක් පරිවාස කාලය තුළ ලබාගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම.

10.1 නියාමක තනතුරේ සිට සැරයන් තනතුරට උසස් කිරීම.
සැරයන් තනතුරට උසස් කිරීමේදී පූරප්පාඩු ගණන් කළ යුත්තේ ඊට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනටය.
උසස් කරනු ලබන ප්‍රතිශතයන්
ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත 33.33%
ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත 66.67%

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය අනුව සැරයන් තනතුරට උසස් කිරීම

I. පත්වීම ස්ථිර කර තිබීම.
II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නියාමක ශ්‍රේණියේ අවම වශයෙන් වසර අටක (08) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක අටක් (08) උපයාගෙන තිබීම.
III. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට අනුශංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.
V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.
VI. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර අට (08) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :
ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය අනුව සැරයන් තනතුරට උසස් කිරීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ඒ සම්බන්ධ විස්තර ඇමුණුම 02 යටතේ ඇතුළත් කර ඇත.

10.1.2. ලිඛිත විභාගය අනුව සැරයන් තනතුරට උසස් කිරීම
10.1.2.1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.
II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නියාමක ශ්‍රේණියේ අවම වශයෙන් වසර අටක (08) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.
III. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර අට (08) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.
VI. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

10.1.2.2 උසස් කිරීමේ ක්‍රමය :

ලිඛිත විභාගයේ ප්‍රතිඵල අනුව සැරයන් තනතුරට උසස් කිරීමේ විභාග පිළිබඳව හා උසස් කිරීම සම්බන්ධයෙන් නියමයන් ඇමුණුම 03 යටතේ ඇතුළත් කර ඇත.

11. තනතුරු වලට පත් කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :
බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගන්නා නිලධාරීන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන තනිකඩ නිල නිවාසවල අවම වශයෙන් වසර පහක් (05) නතරවී සේවය කළ යුතුය.

බන්ධනාගාර නියාමක තනතුරට පත්වන නිලධාරීන්ට බන්ධනාගාර පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානයේදී අදාල රාජකාරි සම්බන්ධව විධිමත් පුහුණුවක් * ලබා දෙන අතර, ඊට අමතරව යුධ හමුදා සෙබළුන්ට සමාන පුහුණුවක්ද ලබාදෙනු ලබයි. පුහුණු කාල සීමාව තුළදී විවාහ වීමට අවසර නොමැත. දිවයිනේ ඕනෑම බන්ධනාගාර ආයතනයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය. තවද විශේෂ ගණයේ සහ ත්‍රස්තවාදී සිරකරුවන් /සැකකරුවන් රඳවා ඇති බන්ධනාගාර ආයතනවල රාජකාරි කටයුතු වල යොදවනු ඇත. පුහුණුවෙන් පසු වසර 10 ක කාලයක් අනිවාර්යයෙන් ඔවුන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදෙන බවට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් සමඟ ගිවිසුමකට ඇතුලත් විය යුතුය. පුහුණු කාලය තුල පුහුණුව අතහැර යන හෝ පුහුණුවෙන් පසු ගිවිසුම ප්‍රකාර නියමිත සේවා කාලයකට පෙර තනතුර අතහැර යන නිලධාරීන් පුහුණුව සඳහා යන සියළුම වියදම් සහ අනෙකුත් වියදම් දෙපාර්තමේන්තුවට ගෙවීමට බැඳී සිටිය යුතුය.

(*පුහුණුව වර්ග කිරීම : පර්යේෂණ විශෝධන මධ්‍යස්ථානයේදී මාස 03 ක පුහුණුවක් සහ මාස 09ක කාලයක් සඳහා ප්‍රායෝගික පුහුණුවක් ලබා දී අවසානයේදී පුහුණු සහතිකය නිකුත් කරන අතර, ඉන් පසුව ස්ථිර සේවා ස්ථානයට අනුයුක්ත කරනු ලැබේ. සේවා අවශ්‍යතාවය අනුව පුහුණු කාල සීමාව සහ පුහුණු කරනු ලබන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වන තීරණ කලින් කලට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් ගනු ලැබේ.)

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ : අදාළ නොවේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය

I. මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති RS - 01 – 2006 A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

II. සේවා කාලය ගණන්ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

III. පෙර තනතුරේ හා වර්තමාන තනතුරේ සේවා කාලය එකතු කළ පසු ගබඩාභාර නිලධාරීන් වසර 12 ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇත්නම් බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වන දින සිට සැරයන් තනතුරට උසස් කර නියමිත වැටුප් පියවරේ තබනු ලැබේ. (හිඟ වැටුප් රහිතව)

IV. ඊට අඩු සේවා කාලයක් ඇති ගබඩා නිලධාරීන් නියාමක තනතුරට පත්කර හිඟ වැටුප් ගෙවීමකින් තොරව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දින සිට අදාළ වැටුප් පියවරේ තැබීම.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17.අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ.

සකස් කළේ : අත්සන : ..........................................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :........ ඩබ්ලිව්.ටී.එන්. වසන්ත කුමාර

පරිපාලන නිලධාරී - I

තනතුර :...... භාණ්ඩාගාර මූලස්ථානය

දිනය : 2025/01/07 කොළඹ - 09.

පරීක්ෂා කළේ : අත්සන : ..............................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :............ දොනල්ඩ් මුරගේ .........

තනතුර ...... භාණ්ඩාගාර කොමසාරිස් (මානව සම්පත්)

භාණ්ඩාගාර මූලස්ථානය

කොළඹ 09.

දිනය : 2025/01/08

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : .........................................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :.........................................

තනතුර :..................................

නිල මුද්‍රාව : එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය

භාණ්ඩාගාර කොමසාරිස් ජනරාල්

භාණ්ඩාගාර මූලස්ථානය

කොළඹ - 09.

දිනය : 2025/01/08

18. අමාත්‍යාංශ නිර්දේශය

යොමු අංකය : ..................................................

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ..................දින අනුමත කරන ලද ...........අමාත්‍යාංශයෙහි/දෙපාර්තමේන්තුවෙහි .....................සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශකර ඉදිරිපත් කරමි.

අත්සන : .......................................................

නම :......................................................

ලේකම්

(අදාළ අමාත්‍යාංශ ලේකම්)

දිනය : 2024/12/

නිලමුද්‍රාව :..................................................

19. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය

යොමුඅංකය : ..................................................

................................අමාත්‍යාංශයෙහි/දෙපාර්තමේන්තුවෙහි ..................සේවා ගණය සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ....................දින අනුමත කරන ලදී.

අත්සන :..............................................

නම :...............................................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2024/12/

නිලමුද්‍රාව :.................................................

ඇමුණුම 01

විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පොලිස් හා අනෙකුත් නියාමන සේවා සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පැය 03 | 100% | 40% |

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | | | |
| 1. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 02 | 100% | 40% |
| 2. මුදල් රෙගුලාසි | පැය 02 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| **1 වන කාර්යක්ෂමතා කඩඉම** | 1. බන්ධනාගාර නියාමකවරුන්ගේ රාජකාරි හා වගකීම් ඇසුරින්.<br>2. දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග.<br>3. බන්ධනාගාර ආඥා පනත.<br>ඉහත ඇති සියළුම කරුණු පිළිබඳව දැනුමක් ලබා ගැනීම සඳහා අදාළ ප්‍රශ්න පත්‍රය පිළියෙල කරනු ඇත. |
| **2 වන කාර්යක්ෂමතා කඩඉම** | 1. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය.<br>මෙම ප්‍රශ්ණ පත්‍රය ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br>II වන පරිච්ඡේදය - මාරු කිරීම්<br>VII වන පරිච්ඡේදය - වැටුප්<br>XII වන පරිච්ඡේදය - නිවාඩු<br>XIII වන පරිච්ඡේදය - දුම්රිය බලපත්‍ර<br>XIV වන පරිච්ඡේදය - දිවයින ඇතුලත රාජකාරි ගමන්<br><br>XVIII වන පරිච්ඡේදය - නිල නිවාස<br>XXXII වන පරිච්ඡේදය - දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම.<br>XLVII වන පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම හා විනය<br><br>2. මුදල් රෙගුලාසි<br>1. මෙම ප්‍රශ්ණ පත්‍රය මුදල් රෙගුලාසි වල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br>2. I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු<br>3. මු.රෙ.1, 2:1, 3,4, 10, 15, යන වගන්ති<br>4. II වන පරිච්ඡේදය - වියදම්, ආපසු ගෙවීම්, කපා හැරීම් ආදිය සඳහා අධිකාරී බලය<br>5. මු.රෙ 102, 103, 104, සහ 105 වගන්ති<br>6. III වන පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව.<br>7. මු.රෙ 138, 139 සහ 140 වගන්ති<br>8. V වන පරිච්ඡේදය - ගෙවීම්<br>9. මු.රෙ 238 වගන්තිය |

සකස් කළේ :

අත්සන :....................................................

නම : ඩබ්ලිව්.ඩී.එක්. වසන්ත කුමාර

තනතුර : විශාලක නිලධාරී - I

දිනය : 2025/01/07

බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

පරීක්ෂා කළේ :

අත්සන : ....................................................

නම : ඩොනල්ඩ් මුරගේ

තනතුර : බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්)

දිනය : 2025/01/8

බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

අත්සන : ....................................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ....................................................

තනතුර : ....................................................

දිනය : 2025/01/08

නිල මුද්‍රාව : එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

ඇමුණුම 02

යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පිළිබඳ ආකෘතිය

01. සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට අදාළ කරුණු - බන්ධනාගාර නියාමක තනතුරේ සිට බන්ධනාගාර සැරයන් තනතුරට උසස් කිරීම (ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත) පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව 1:5 අනුපාතයට අනුව ජ්‍යෙෂ්ඨතා පිළිවෙලට නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

02. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1.ජ්‍යෙෂ්ඨත්වය (නියාමක තනතුරේ වසර 05 ට පසු) | 60 | අදාළ නොවේ. |
| 2.ප්‍රශංසා | 05 | |
| 3.ක්‍රීඩා | 10 | |
| 4.සුභසාධක හා ආගමික කටයුතු | 05 | |
| 5.යහපත් සේවයට වාර්තා කිරීම (පසුගිය වසර 05 තුළ) | 05 | |
| 6.විෂය සමගාමී පාඨමාලා සහ වෙනත් උසස් අධ්‍යාපන සුදුසුකම් | 05 | |
| 7.සේවා කුසලතාවය | 05 | |
| 8.සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

සටහන

i. සැරයන් තනතුරට උසස් කිරීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය වාර්ෂිකව පවත්වනු ලැබේ.

ii. සැරයන් තනතුරට උසස් කිරීමේ දිනය ලෙස සලකනු ලබන්නේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ දිනය වේ.

iii. ඉහත වගුවේ දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටියක් අනුමත කිරීම බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ඇත.

iv. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී එක් එක් අයදුම්කරුවන් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සැරයන් තනතුරට උසස් කරනු ලැබේ.

03. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධාරියා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

04. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වාර්ෂිකව

සකස් කලේ :

අත්සන :......................................
නම : ඩබ්ලිව්.ටී.එන්. වසන්ත කුමාර
තනතුර : පරිපාලන නිලධාරි - 1
දිනය : 2025.[illegible] බන්ධනාගාර මූලස්ථානය කොළඹ - 09.

පරීක්ෂා කලේ :

අත්සන :......................................
නම : [illegible]
තනතුර : [illegible] කොමසාරිස් [illegible]
දිනය : 2025.[illegible] බන්ධනාගාර මූලස්ථානය කොළඹ 09.

අත්සන :......................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :......................................
තනතුර :......................................
දිනය : 2025.[illegible]
නිල මුද්‍රාව : [illegible]
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

## විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ නම : ලිඛිත විභාගය අනුව සැරයන් තනතුරට උසස් කිරීම

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බන්ධනාගාර ආඥා පනත හා බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | පැය 02 | 100% | 40% |
| මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම් | පැය 01 | 100% | 40% |

සටහන

i. සැරයන් තනතුරට උසස් කිරීමේ ලිඛිත පරීක්ෂණය වාර්ෂිකව පවත්වනු ලැබේ. වාර්ෂිකව ලිඛිත විභාගය පැවැත්වීමට නොහැකි වන අවස්ථාවලදී ඊට පසු වර්ෂයක පැවැත්වෙන විභාගයේ ප්‍රතිඵල එක් එක් වර්ෂවල පැවති පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා අදාළ කර ගනු ලැබේ. එහිදී ඒ ඒ වර්ෂවල දෙසැම්බර් 31 දිනට සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගේ ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව සැරයන් තනතුරට උසස් කරනු ලබන අතර, එක් වර්ෂයක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට තරම් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැතිනම් ඊට පසු වර්ෂයේ ලිඛිත විභාගය අනුව බඳවා ගනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව සඳහා එම ප්‍රමාණය එකතු කරනු ලැබේ.

ii. සැරයන් තනතුරට උසස් කිරීමේ දිනය ලෙස සලකනු ලබන්නේ ලිඛිත පරීක්ෂණය පැවැත්වූ දිනය වේ.

iii ලිඛිත විභාගයේ ප්‍රතිඵල අනුව ඊට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා වන සියළුම පුරප්පාඩු සම්පූර්ණ කල නොහැකි අවස්ථාවකදී එම පුරප්පාඩු ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතා ධාරාව යටතේ සම්පූර්ණ කරනු ලැබේ.

iv. සැරයන් තනතුරට උසස් කිරීමේ ලිඛිත පරීක්ෂණය විභාග කොමසාරිස් ජනරාල්වරයා හෝ බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන ආයතන විසින් පවත්වනු ලැබේ.

03. විභාගය පවත්වනු ලබන බලධාරියා : විභාග කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු පැවතීම අනුව

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බන්ධනාගාර ආඥා පනත හා බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | සියළුම වගන්ති |
| මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම් | සාමාන්‍ය දැනීමක් අපේක්ෂා කරයි. |

සකස් කළේ :
අත්සන :
නම : ........ වසන්ත කුමාර
තනතුර : පරිපාලන නිලධාරි - I
බන්ධනාගාර මූලස්ථානය
දිනය : 2025/01/07
කොළඹ - 09.

පරීක්ෂා කළේ :
අත්සන :
නම :
තනතුර : බන්ධනාගාර කොමසාරිස් (........)
බන්ධනාගාර මූලස්ථානය
දිනය : 2025/01/
කොළඹ 09.

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :
තනතුර :
දිනය : 2025/01/
නිලමුද්‍රාව : ........ එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

*විභාග පිළිබඳ ආකෘතිය*

01. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයට අයත් බන්ධනාගාර නියාමක තනතුර සඳහා බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමේ ලිඛිත තරඟ විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය බුද්ධිය | පැය 01 | 100% | 40% |
| සාමාන්‍ය දැනීම | පැය 01 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග : පූරප්පාඩු පැවතීම අනුව

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය බුද්ධිය | සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යූහයන් ආශ්‍රයෙන් සිතීමේ තර්කානුකූලභාවය, විශ්ලේෂණ කුසලතාවය, නිර්ණය කිරීමේ ශක්තිය විනිශ්චය කිරීම සඳහා බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. (කාලය පැය 01) |
| සාමාන්‍ය දැනීම | ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ආශ්‍රයෙන් වැදගත්වන කරුණු ඇතුළත් දැනුම පරීක්ෂා කිරීම සඳහා බහුවරණ ක්‍රමයට සැකසූ ප්‍රශ්න පත්‍රයකි (කාලය පැය 01) |

සකස් කළේ :
අත්සන :
නම : ඩබ්ලිව්.ටී.එන්. වසන්ත කුමාර
තනතුර : පරිපාලන නිලධාරී - I
දිනය : 2025/01/27
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

පරීක්ෂා කළේ :
අත්සන :
නම :
තනතුර :
දිනය : 2025/01/
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :
තනතුර :
දිනය : 2025/01/
නිල මුද්‍රාව : එච්. ... න්. උඩුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.